මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය රත්නජීවන් හූල් නිරෝධායන නීති කඩ කළ බවට චෝදනා නගමින් වන ඒකපාර්ශවික වාර්තාකරණයන් පසුගිය දින කිහිපය පුරාම දක්නට ලැබිණි. පහත දැක්වෙන අරුණ ප්‍රවෘත්තිය ඊට නිදසුනකි.

මැයි 22 දින ඩේලි මිරර් මගින් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රියව සම්බන්ධ කරගනිමින් මේ සම්බන්ධයෙන් කරුණු විමසා සිටී. එහිදී මහාචාර්ය හූල් හට දියණිය සමඟ පිටව ගොස් දින 14ක නිරෝධායන කාලයකින් පසු පැමිනෙන ලෙස තමන් දැන්වූයේ යැයි කියැවෙන වාර්තාවන් ප්‍රතික්ෂේප කරන බව මහින්ද දේශප්‍රිය ඩේලි මිරර් වෙත පවසා සිටී.

මේ අතර, මැයි 22 ඩේලි මිරර් හි පළවූ පුවතට හාත්පසින්ම වෙනස් පුවතක් මැයි 25 දින අරුණ මගින් ප්‍රකාශයට පත් කරයි. අරුණ පවසන්නේ මහාචාර්ය හූල් හට දියණිය සමඟ පිටව ගොස් දින 14ක නිරෝධායන කාලයකින් පසු පැමිනෙන ලෙස මැ.කො.ස. දේශප්‍රිය විසින් දැන්වූ බවයි. මෙම කරුණු සනාථ කර ගැනීම සඳහා අරුණ පුවත්පත මගින් මැ.කො.ස. දේශප්‍රියව සම්බන්ධ කරගෙන හෝ නොමැත. මෙසේ බලනා විට අරුණ ප්‍රවෘත්තිය ඒකපාර්ශවීය නොවේද? පාඨකයින්ට අරුණ ප්‍රවෘත්තියේ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් ගැටළුවක් පැන නොනගින්නේද? පාඨකයින් විසින් විශ්වාස කළ යුතු වන්නේ කුමන ප්‍රවෘත්තියද?

මේ වගකීම් සහගත මාධ්‍යකරණයද?

**#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #News #SathiAgaAruna #Dailymirror**